*ISBN 978-955-4563-72-8*

# පැරණි ශ්‍රී ලංකාවේ නීතිය තුළ භාරතීය නීති ක්‍රම හා සිරිත් විරිත්

**පී.එම්.යූ.ප්‍රේමරත්න**

**ඉතිහාස අධ්‍යයන අංශය- කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂේපය**

*සමාජයේ යහපැවැත්ම, සදාචාරය, සමාජ සාධාරණත්වය පවත්වාගෙන යනු වස් නීතිය අත්‍යවශ්‍ය වූ කරුණකි. නූතන මතයන්ට අනුව සාධාරණත්වය සංවිධානය කිරීම රාජ්‍යයකට අයත් වඩාත් ම වැදගත් කාර්යයක් බවට සැකයක් නැත. පීඩාවට පත්වූවන්ට සහාය ලබා ගැනීමට නීතිය අත්‍යවශ්‍යය. භාරතය ගත්කල පැරණි භාරතයේ නීතිය සම්පූර්ණයෙන් ම පාහේ වර්ණභේදය පදනම් කරගෙන සකස් වූවක් බව පෙනේ. මේ හේතුවෙන් ටික කලක් යනතුරු එය නම්‍යශීලී නොවිණි. නමුත් පැරණි ඉන්දියානු නීති ක්‍රමය සකස් කිරීමේ සාධක වූයේ ද සමාජ සාධාරණත්වය, සදාචාරය, යුක්තිය යනාදී මූලධර්මයන් ය. එමෙන් ම සමාජය වෙනස්වීමත් සමග පුරාණ හා යල් පැනගිය නීති වෙනුවට ව්‍යවහාරික හා පිළිගත හැකි නීති සකස් වී ය. මෙකී භාරතීය නීති ක්‍රම මෙරට නීතිය තුළට එක් වී ඇත්තේ කුමනාකාරයෙන් ද යන්න විමර්ශනය කිරීම මෙම ලිපියේ අරමුණ යි. එහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරිණි.*

## හැඳින්වීම

භාරතය විශාල රටක් වන අතර එහි සමාජ, ආර්ථික, දේශපාලන ආදී අංශ ගත් කල උත්තර හා දක්ෂිණවශයෙන් ඒ සෑම අංශයක ම පාහේ වෙනස්කම් දක්නට ලැබේ.ඒ අනුව භාරතීය නීති ක්‍රම හා සිරිත් විරිත් ගත්ත ද උත්තර හා දක්ෂිණ ලෙස භාරතීය බලපෑම කොටස් දෙකක් යටතේ සාකච්ඡා කළ හැකි ය. එයට හේතුව එම කොටස් දෙක තුළින් ම පැහැදිලි වෙනස්කම් පැරණි ශ්‍රී ලංකාවේ නීතියට සිදු වී ඇති නිසා ය.

## පැරණි ශ්‍රී ලංකාවේ නීතිය තුළට භාරතීය නීති ක්‍රම හා සිරිත් විරිත් එක් වී ඇති ආකාරය

ක්‍රි.පූ. හයවන සියවසේ පමණ සිට ලංකාවට ආර්යයන් සංක්‍රමණය වූ බව පිළිගත් මතයකි. නමුත් ඔවුන් පැමිණියේ භාරතයේ කුමන ප්‍රදේශයක සිට ද යන්න තවමත් ස්ථිර වශයෙන් නිශ්චය කොට නොමැත. එහෙත් විජයාගමනයෙන් පසු ව ද වරින්වර මෙරටට ආර්ය කණ්ඩායම් කිහිපයක් පැමිණි බව සඳහන් වීමෙන්(*මහාවංසය*, 1994) විජය කතා ප්‍රවෘත්තියේ යම් සත්‍යතාවක් ඇතැයි සිතිය හැකි ය. කෙසේ වෙතත් ඔවුන් එසේ පැමිණෙද්දී එවකට ඉන්දීය සමාජයේ තිබූ විවිධ පන්තිවල උස් පහත් භේදය, පවුල් ක්‍රමය පිළිබඳ අදහස්, සිරිත් විරිත් හා සංස්ථා ද රැගෙන එන ලදී (එල්ලාවල, 1962). එම්.එල්.එස්. ජයසේකර මහතා පවසන්නේ විජය ලංකාවට නීති ක්‍රමයක් ගෙන ආ බවත්, එය නොවෙනස් ව ලංකාවේ දිගට ම ක්‍රියාත්මක වූ බවත් ය (Jayasekera, 1954).

විජය රජු ලංකාවට පැමිණි බව සැලකෙන කාල පරිච්ඡේදයේ භාරතයේ පැවතියේ මනු නීති සම්ප්‍රදාය යි(විද්‍යාලංකාර, 2000). ඒ අනුව මෙහි නෛතික අදහස්වලට හින්දු ආභාසය ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය. ක්‍රි.පූ. සවන සියවසත්, දෙවන සියවසත් අතර කාලයේ රචනා වූ ධර්ම සූත්‍ර ග්‍රන්ථ හින්දු නීතිය අඩංගු පැරණි ම ග්‍රන්ථ ලෙස සලකනු ලැබේ. ධර්මසූත්‍ර ග්‍රන්ථ හැරුණුවිට ඉතා වැදගත් වන්නේ ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථ යි. මෙකී දෙකොටස එක්ව ගත් කල "ස්මෘති" යනුවෙන් හැඳින්වෙන අතර ඒ අනුව මානව ධර්ම ශාස්ත්‍රය "මනුස්මෘති" නම්වේ(මනම්පේරි, 1988).ඒ අනුව මෙම ස්මෘති ග්‍රන්ථයන්හි ඇතුළත් වූ නීතියට සම්බන්ධ අදහස් ලක්දිවට පැමිණි ආර්යයන් ද රැගෙන එන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ක්‍රි.පූ. හයවන සියවසේදී පමණ භාරතයේ සිට පැමිණි ආර්යයන් එහි තිබූ යම් ආකාරයක නීතිය පිළිබඳ අදහස් මෙරටට ගෙන ආ බව ත් ඒවා පසුකාලීන ව වෙනස්කම්වලට භාජනය වෙමින් ලංකාවේ සමාජයට සුදුසු පරිදි හැඩගැසුණු බවත් සිතීමට මින් හැකියාව ලැබේ.

මූලාශ්‍රයන්හි එන තොරතුරුවලට අනුව විජයාගමනයට පෙර මෙරට විසුවෝ යක්ෂ, නාග ගෝත්‍රවලට අයත්වූවෝ වෙති. ඔවුනතර පැවති නීතිය කෙබඳු එකක් ද යන්න නිශ්චිත වශයෙන් ම කිව නොහැකි ය. නමුත් විජය රජු විසින් ගෙන ආ නෛතික අදහස් මෙරට ජනතාව පිළිගත් බව සිතිය හැකි ය. ආර්යයන්ගෙන් අපට උරුම වූ නීතියක් ලෙස "සමකුල විවාහ චාරිත්‍රය" පෙන්වාදිය හැකි බව හේම එල්ලාවල මහතා පවසයි(එල්ලාවල, 1962).මුලින් විජය තමාට සමාන තත්වයේ කන්‍යාවක් නොලැබුණු නිසා අභිෂේකය ප්‍රතික්ෂේප කළේ ය (*මහාවංසය*, 1994).මෙහි ප්‍රතිඵලයක්

***ISBN 978-955-4563-72-8***

ලෙස ක්ෂත්‍රිය කන්‍යාවක් විජය ආවාහ කරගත් අතර විජයගේ අමාත්‍යවරුන් ආවාහ කර ගත්තේ ද ඔවුන්ට සුදුසු වූ සමකුල කුමාරිකාවන් ය (*මහාවංසය*, 1994).පණ්ඩුවාසුදේව රජුගේ අභිෂේකය සඳහා ද ඔහුට සුදුසු කුල කුමරියක් සිට තිබේ (*මහාවංසය*, 1994).සුමනා නමැති ගැමි දැරියක සමග විවාහ වූ තිස්ස නමැත්තෙකු පිළිබඳ ව රසවාහිනියේ සඳහන් වන අතර මෙම විවාහයට ඇගේ මව්පියන් එකඟ වී ඇත්තේ (කුලවංසං පුච්ඡිත්වා) තිස්සගේ පවුල හා පෙළපත සම්බන්ධයෙන් තොරතුරු විමසා බැලීමෙන් අනතුරුව ය(*රසවාහිනිය*, 1920).

දුටුගැමුණු රජුගේ පුත්‍රයා වූ සාලිය කුමරුට රජකම අහිමි වූයේ ඔහු තමාට නොගැළපෙන විවාහයක් කරගත් හෙයිනැයි මූලාශ්‍රයට අනුව පැහැදිලි වේ.  ඒ අනුව හින්දු කුල ක්‍රමය පිළිබඳ අදහස් මෙරට නීතියට එක් වූ බව මෙම තොරතුරුවලින් පෙනේ.ස්මෘති ග්‍රන්ථවලට අනුව කුල සම්බන්ධයෙන් තිබූ නීතිරීති ඉතාදැඩි වූ බව පැහැදිලි වේ. පහත් කුලයන්හි ජනයාට සමාජයේ ද ඉතා පහත් ස්ථානයක් හිමි වූ අතර මෙම අදහස ලාංකේය සමාජයට දබලපෑ බව වංසකථාවෙන් පැහැදිලි වේ. එනම්, පණ්ඩුකාභය කුමරු රජවී අනුරාධ ග්‍රාමය, රෝහල්, සුසාන භූමි, මංමාවත් ඇතුළු පුරයක් බවට පත් කිරීමෙන් පසු,

> **"නගරශෝධක පන්සියයක් සැඬොල් මිනිසුන් ද,**
> **වර්චස් ශෝධක දෙසීයක් සැඬොල් පුරුෂයන් ද,**
> **මළමිණී බැහැර ගෙනයන්නා වූ එකසිය පණහක් සැඬොලුන් ද**
> **සොහොනින් වයඹිදිග උන්ගේ ගම් ද පිහිටුවී ය.**
> **ඒ මිනිස්සු විධි වූ පරිද්දෙන් ඒ කර්මයන් නිබඳ කළාහු ය.**
> **ඒ සැඬොල් ගමට ඊසාන දිග්හි නීච සුසාන යයි**
> **නම්ලත් සැඬොලුන්ගේ සොහොන කරවී"**

(*මහාවංසය*, 1994)

යනුවෙන් සඳහන් වේ. ඒ අනුව ආර්යයන් එකල සමාජයේ ප්‍රචලිත ව තිබූ ස්මෘති ග්‍රන්ථයන්හි පැවති සංකල්ප මෙරටට ගෙන ඒම නිසා ඒවා මෙරට සමාජයේ මුල් බැසගන්නට ඇති බව සිතිය හැකි ය. මෙරටට පැමිණි ආර්යයන් හින්දු චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කළ පිරිසක් ලෙස සිතිය හැකි අතර මෙරට බිහිවූ බ්‍රාහ්මණ සමාජය මේවා ආරක්ෂා කිරීමට නිතොර ව ඇපකැප වී ය. මහාභාරතයේ, රජතුමා ප්‍රථමයෙන් පුරෝහිතයාට සත්කාර කළ යුතු බව ත් ඉන් පසු අභිෂේකය කළ යුතු බව ත් සඳහන් වේ(*මහාභාරතය*, 2006). දේවානම්පියතිස්ස රජුට පූර්වයෙන් ලංකාවේ ක්‍රියාත්මක වූ අභිෂේක ක්‍රමයේ ප්‍රමුඛතාව හිමිවූයේ බ්‍රාහ්මණයෙකුට ය. අභිෂේකෝත්සවයට චතුර්වර්ණයේ ම නියෝජිතයන් පැමිණිය යුතු බව ද පුරෝහිතයා විසින් බ්‍රාහ්මණ සමාජයේ නීතිරීති අනුව අභිෂේකය සිදුකළ බව ද හේම එල්ලාවල මහතා පවසයි(එල්ලාවල, 1962). මේ හැරුණුවිට ලක් රජවරුන් මනු නීතිය ඉගෙනගත් බව මූලාශ්‍රයට අනුව පැහැදිලි වේ.

> **"මනුනීතික්කමං කිඤ්චි අවොකකම්ම මහීපතී"**
> (*ඌනපූරණසහිතො මහාවංසො*, 1996)

දෙවන විජයබාහු රජතුමා මනුනීතිය නොඉක්මවා කටයුතු කළ ආකාරය මහාවංසයේ සඳහන් වන්නේ ඉහත ආකාරයට යි. එසේ ම දෙවන පරාක්‍රමබාහු රජු ද මනු නීතියෙහි දක්ෂයෙකු වූ බව මහාවංසයේ සඳහන් වේ.

> **"ඉක්බිති මනු නීතියෙහි දක්ෂ වූ ඒ රජ තෙමේ...."**
>
> (*මහාවංසය,* 1994)

මෙම තොරතුරු අනුව විධිමත් නීතියක් කෙසේ වෙතත් යම් ආකාරයක නීති ක්‍රමයක් ආර්යාගමනය තුළින් ලැබුණු බව සිතිය හැකි ය. නමුත් ඉතා පැහැදිලි ව ම භාරතීය නීති ක්‍රම හා සිරිත් විරිත් මෙරට සමාජයට ලැබුණේ මෞර්ය අධිරාජ්‍ය යුගයේදී බව කිව හැකි ය. මූලාශ්‍රයේ එන තොරතුරුවලට අනුව මෞර්ය අධිරාජ්‍ය සමයේදී ශ්‍රී ලංකාවට ප්‍රථම වරට විධිමත් අභිෂේක ක්‍රමයක් ලැබිණි. මුටසීව රජුගේ පුත්‍රයා වූ තිස්ස රාජත්වයට පත්වීමෙන් පසු අශෝක අධිරාජයා වෙත තුටු පඬුරු රැගෙන මෙරටින් දූත පිරිසක් භාරතයට ගිය අතර අශෝක අධිරාජයා විසින් ඔවුන්ට විවිධ තනතුරු පිරිනමන ලදී. මෙම තනතුරු නාම අතර නීතිය සම්බන්ධ තනතුරක් වන "**දණ්ඩනායක**" තනතුර  දේවානම්පියතිස්ස රජුගේ දූත පිරිසේ සිටි ඇමතියාට ප්‍රදානය කළ බව මහාවංසයේ සඳහන් වේ (*මහාවංසය,* 1994). ඒ අනුව අශෝක රජුගේ කාලයේදී ඉන්දියාවේ ක්‍රියාත්මක වූ අධිකරණ ක්‍රමයේ යම් යම් අංග ලංකාවට ද ලැබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

*ISBN 978-955-4563-72-8*

මේ යුගයේදී අශෝක අධිරාජයා විසින් සිදු කරන ලද නව රට සසුන් පිහිටුවීමේ දහම් ව්‍යාපාරය යටතේ ශ්‍රී ලංකාවට ද බුදුදහම ලැබිණි. මේ මගින් ලංකාවට ලැබුණේ බුදුදහම පමණක් ම නොවේ. මේ වනවිට භාරතයේ පිළිගෙන තිබූ නෛතික අදහස් ද ලැබුණු බව සිතිය හැකි ය. දුමින්දාගමනය සමගින් අටළොස් කුලයක ශිල්පීන් මෙරටට පැමිණි බව සඳහන් වීමෙන් (*මහාවංසය*, 1994) ඒ ඒ කුලයන්ට අයත් සම්ප්‍රදායයන් පසුකාලීන ව නීති වශයෙන් සිංහල සමාජයේ මුල් බැසගන්නට ඇතැයි කිව හැකි ය. මෞර්ය යුගයේදී භාරතයේ කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය වැනි දියුණු නීති ග්‍රන්ථ සම්පාදනය වූයේ ය. ඒවායේ සඳහන් නීති මනු නීතියට වඩා ප්‍රායෝගික වීම නිසා භාරතීය රජුන් මනු නීතිය එකහෙළා ප්‍රතික්ෂේප නොකළ ද ඊට වඩා වැඩි අවධානයක් කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය කෙරෙහි යොමු කළ බව පෙනේ. මෙම කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය අධ්‍යයනය කිරීම ලක් රජවරුන් විසින් ද සිදු කරන ලද බව වංසකථාවෙන් පැහැදිලි වේ. එනම්, පළමුවන පරාක්‍රමබාහු රජතුමා කොටල්ල ආදී නොයෙක් නීතියෙහි පරතෙර පැමිණි බව සඳහන් වේ.

**"කොටල්ලාදිසු නීතිසු ....පාරප්පත්තො"**

(*ටීකාසහිත මහාවංසො*, 1996)

එසේ ම පරාක්‍රමබාහු රජු කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ සඳහන් යුද්ධ සඳහා දුන් උපදෙස් මනාකොට විමසා බැලූ බව ද සඳහන් ය.

**"යුදෙධාපයොගීකොවල්ල සත්ථයුද්දණ්ණවාදිකං"**

(*ටීකාසහිත මහාවංසො*, 1996)

ශාක්‍ය, මෞර්ය, ලම්භකර්ණ යන වංශයන්ට අයත් පිරිස් විටින්විට ලංකාවට සංක්‍රමණය වූ අතර ඔවුන්ගෙන් ශ්‍රී ලංකාවේ නීති ක්‍රමයට ද විවිධාකාරයේ බලපෑම් සිදුවී ය. විජය රජුගෙන් පසු ලංකාවේ රාජත්වයට පත් වූ පණ්ඩුවාසුදේව රජුගේ මෙහෙසිය වූයේ ශාක්‍යවංශික කාන්තාවකි. ඇය සමග ඇගේ සොයුරන් පිරිසක් ද මෙරටට පැමිණි බව වංසකථාවේ දැක්වේ. ඒ අනුව භාරතයේදී ඔවුන් පුරුදු පුහුණු වී සිටි චාරිත්‍ර වාරිත්‍ර මෙරටේ ද ක්‍රියාත්මක කිරීම නිසා ඒවා පසුකාලීන ව නීති බවට පරිවර්තනය වන්නට ඇත. සිංහලයන්ගේ පුද්ගල නීතිය යටතේ විවාහක කාන්තාවන් සතු වූ පෞද්ගලික දේපොළ භුක්ති විඳීමේ අයිතිය විකාශනය වී තිබෙන්නේ මෙම ශාක්‍යයන්ගේ නීතිය යටතේ ය(විද්‍යාලංකාර, 2000).එසේ ම ඇවැස්ස විවාහය ලාංකේය චාරිත්‍රවලට එක්වී ඇත්තේ ද ශාක්‍ය චාරිත්‍රවලින් ය. පණ්ඩුකාභය කුමරු ආවාහ කරගත්තේ තම මවගේ සහෝදරයාගේ දියණිය වූ ස්වර්ණපාලිය යි. පණ්ඩුකාභය රජුගේ දියණිය වූ චිත්‍රා කුමරිය දීඝගාමිණී කුමරු සමග විවාහ වී ය (*මහාවංසය*, 1994) දීඝගාමිණී කුමරු යනු චිත්‍රා කුමරියගේ මයිලණුවන්ගේ පුත්‍රයා ය. නන්දික නමැති පුද්ගලයෙකුට රේවතී නම් සැදෑ නැති තම නෑනා විවාහ කරගැනීමට සිදුවූ ආකාරය සද්ධර්මරත්නාවලියේ "නන්දික උපාසකගේ වස්තුවේ" සඳහන් වේ(*සද්ධර්මරත්නාවලිය*, 2011). සද්ධර්මරත්නාවලියේ ශාක්‍යයන්ගේ ප්‍රභවය පිළිබඳ කෙරෙන විස්තරය තුළින් ඇවැස්ස විවාහය මෙරට මුල් බැසගෙන ඇති බව තහවුරු වේ.

**"මගේ මලුන් හෙයින් තොපගේ මයිලෝ ය.**

**උන්ගේ දූ ඇත්නම් තොපට බිසෝ කරවයි....**

**අවශ්‍ය බැණන් හෙයින්ගෙන්වාත්**

**පාවා දුනමනා තැන කළදැම යහපති."**

(*සද්ධර්මරත්නාවලිය*, 2011)

ඒ අනුව මෙවැනි චාරිත්‍ර නීතියට ද එක් විය. ශාක්‍ය චාරිත්‍ර වාරිත්‍ර මෙන් ම මෞර්ය චාරිත්‍ර වාරිත්‍ර ද සමාජයේ නීති ක්‍රමය සකස්වීම සඳහා බලපෑවේ ය. ඉහතදී ද කී පරිදි දුමින්දාගමනයත් සමග විවිධ කුලයන්ට අයත් පිරිස් පැමිණි අතර ඔවුන් භාරතයේ අත්විඳි නීතිරීති මෙරට ද ස්ථාපිත කළ බව සිතිය හැකි ය. විශේෂයෙන් ම තිස්ස රජුගෙන් පසු මෙරට රජවරුන්ගේ අභිෂේක ක්‍රමය සකස් වූයේ මෞර්ය චාරිත්‍ර වාරිත්‍ර අනුව ය. තිස්ස රජු ද අශෝක අධිරාජයාගේ ඉල්ලීම මත නැවත අභිෂේකයක් පැවැත්වූ බව මහාවංසයේ සඳහන් වේ (*මහාවංසය*, 1994). මේ හැරුණුවිට ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා බැඳුණු නොයෙක් චාරිත්‍ර සහ අඳ ගොවි ක්‍රමය හා සම්බන්ධ නොයෙක් චාරිත්‍ර

***ISBN 978-955-4563-72-8***

සඳහා මෞර්ය චාරිත්‍ර වාරිත්‍ර බලපා තිබේ (විද්‍යාලංකාර, 2000). ශාක්‍යයන්ගේ සහ මෞර්යයන්ගේ චාරිත්‍ර මෙන් ම ලම්භකර්ණයන්ගේ චාරිත්‍ර වාරිත්‍ර ද මෙරට නීතියට බලපෑවේ ය. කෙසේ වෙතත් පුරාණ භාරතයේ ක්‍රියාත්මක වූ ඉඩම් භුක්ති ක්‍රමය, කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ නෛතික තත්ත්වයන් ලාංකේය සමාජයට ද බලපෑ බව කිව හැකි ය.

ශ්‍රී ලාංකේය නීති ක්‍රමය සකස්වීම කෙරෙහි උතුරු ඉන්දියානු බලපෑම පැවතියාක් මෙන් දකුණු ඉන්දීය බලපෑම ද පැවති බව පෙනේ. විශේෂයෙන් ම මුල් කාලයේ සිට ම ශ්‍රී ලංකාවට වරින්වර දකුණු ඉන්දියාවෙන් ආක්‍රමණ එල්ල වූයේ ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව සමීප ව පිහිටි රාජ්‍ය දෙකක් නිසා ය. දකුණු ඉන්දියාවේ වරින්වර බලවත් වූ චෝළ, පාණ්ඩ්‍ය, පල්ලව යන වංශයන්ට අයත් ආක්‍රමණිකයන් මේ ආකාරයෙන් ආක්‍රමණ එල්ල කිරීම නිසා සිංහල නීති ක්‍රමයට දකුණු ඉන්දීය බලපෑම ලැබෙන්නට ඇත. අසේල රජු කල එළාර නමැති ද්‍රවිඩ රජු ලංකාවට අක්‍රමණයක් එල්ල කළේ ය (*මහාවංසය*, 1994). පළමුවන සේන රාජ්‍ය කාලයේ පාණ්ඩ්‍ය ආක්‍රමණයක් එල්ල වූ අතර (*මහාවංසය*, 1994) හත්ථදාඨ රජු පැරදවීම සඳහා මාන කුමරුට දෙවන නරසිංහවර්මන් නම් පල්ලව පාලකයා අධාර දෙන ලදී(*ඉන්දියාවේ ඉතිහාසය*, 1962). මෙසේ ද්‍රවිඩ ආක්‍රමණ එල්ල වූ අවස්ථාවන්හි ලාංකේය පාලකයන් ආක්‍රමණිකයන්ගෙන් රට මුදා ගැනීමට කටයුතු කළ අතර පළමුවන විජයබාහු රජු එවැනි එක් නරපතියෙක් ලෙස පෙන්වාදිය හැකි ය. මෙම රජු බොහෝ කාලයක් පිරිහී පැවති අධිකරණ ක්‍රමය දහම් නියාවෙන් පැවැත්වූ බව මහාවංසයේ සඳහන් වේ (*මහාවංසය,* 1994) චෝළ බලපෑම හේතුවෙන් සිංහල නීති ක්‍රමය පරිහානියට පත් ව තිබූ නිසා පළමුවන විජයබාහු රජුට මෙවැනි පියවරක් අනුගමනය කිරීමට සිදු වූ බව උපකල්පනය කළ හැකි ය.

කෙසේ වෙතත් වර්තමාන සිංහල සමාජයේ ද ඇතැම් දකුණු ඉන්දීය සිරිත් විරිත් දක්නට ලැබීමෙන් ගම්‍ය වන්නේ දකුණු ඉන්දීය බලපෑම ලාංකේය නීති ක්‍රමයට ලැබුණු බව යි. මුල් කාලයේ සිට ම සිංහලයන් අතර බහුභාර්යා සේවනය පැවති බව මූලාශ්‍රය විමසීමේදී පෙනී යන කරුණකි. මෙය සිංහල නීතියට එක්වූයේ දකුණු ඉන්දීය බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස ය. බහුභාර්යා හෝ බහු පුරුෂ සේවනය විරල වශයෙන් සිදුවන්නට ඇති බවත් විශේෂයෙන් ම රජවරුන් බහුභාර්යා සේවනයේ නිරත වූ බවත් ඇම්.බී ආරියපාල මහතා පවසයි (ආරියපාල, 1969).වළගම්බා රජුට භාර්යාවන් දෙදෙනෙකු සිටි බවට වංසකථාවෙන් කරුණු හෙළිදරව් වේ (*මහාවංසය*, 1994).මේ ආකාරයට බහුභාර්යා සේවනය රාජකීයයන් හැරුණුවිට වංශවතුන් අතර ද පැවතුණ බව පෙනේ (එල්ලාවල, 1962) මෙයට කදිම නිදර්ශනයක් වෙස්සගිරි ලෙන් ලිපියකින් අනාවරණය කරගත හැකි ය. එහි සඳහන් වන පරිදි අණිකට සෝණ නම් තැනැත්තාගේ පියාට තිස්සා නමැති භාර්යාවක් සිට ඇත (*Epigraphia Zeylanica*, 1941) මෙයින් පැහැදිලි වන්නේ තිස්සා නමින් සඳහන් වන කාන්තාව අණිකට සෝණගේ මව නොවූ බව යි. එසේනම් අණිකට සෝණගේ පියාට තවත් භාර්යාවක් සිටින්නට ඇති බව මේ තුළින් අනාවරණය වේ. කෙසේ වෙතත් මෙම සිරිත ලංකාවේ ස්ථාපිත වීමට බොහෝ සෙයින් හේතුවන්නට ඇත්තේ යට කී ආක්‍රමණිකයන් සමග පැමිණි ද්‍රවිඩ කුලී හේවායන් බව සිතිය හැකි ය.

දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ ජනතාව අතර පවතින නෑ සබඳතා පිළිවෙළට සමාන නෑ සබඳතා පිළිවෙළක් සිංහල සමාජයේ ද පවතී. මවගේ සොහොයුරු සහ භාර්යාවගේ පියා "මාමා"යන එක ම වචනයෙනුත්, පියාගේ සොහොයුරිය සහ භාර්යාවගේ මව "නැන්දා" යන එක ම වචනයෙනුත් හැඳින්වේ(ආරියපාල, 1969).සිංහලයන්ගේ මෙම නෑ සබඳතා පිළිවෙළ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනයා අතර පවතින ක්‍රමයට ඉතා ම කිට්ටු බව ඇම්.බී.ආරියපාල මහතා පවසයි (ආරියපාල, 1969). මේ හැරුණුවිට ඉඩම් භුක්ති ක්ෂේත්‍රයේ පවතින සමහර ද්‍රවිඩ වචන තුළින් ද පැහැදිලි වන්නේ දකුණු ඉන්දීය බලපෑම ලාංකේය නීති ක්‍රමයට ලැබී ඇති බව යි. රජවරුන් විසින් ද්‍රවිඩ කුලී හේවායන්ට දෙන ලද ඉඩකඩම් සෙල්ලිපිවල "**දෙමෙළ් කැබලි**" ලෙස ත් හඳුන්වා තිබෙන අතර ඒවායින් අය කරගත් බදු "**දෙමෙළ් කුලී**" ලෙස ත් හඳුන්වා තිබේ(*Epigraphia Zeylanica, 1941*). මෙසේ ඉඩම් ලද පිරිස් තමන්ට ආවේණික සිරිත් විරිත් අනුගමනය කරන්නට ඇති අතර ඒවා පසුකාලීන ව සිංහල නීති ක්‍රමයට එක්වන්නට ඇත.

ඒ අනුව පැරණි ලංකාවේ නීතිය සකස්වීම සඳහා භාරතීය ආභාසය, බලපෑම ලැබුණු බව පැහැදිලි වේ. රාජ්‍ය උරුමය සම්බන්ධයෙන් වූ නීතිමය තත්ත්වයට ද භාරත බලපෑම දක්නට ලැබේ. භාරතයේ පැවති සම්ප්‍රදාය අනුව පියාගෙන් පසු වැඩිමහල් පුත්‍රයාට රාජත්වය හිමිවී ය (එල්ලාවල, 1962). යම් අවස්ථාවන්හි මේ පිළිවෙළ වෙනස් වුව ද ලංකාවේ ද බොහෝදුරට පියාගෙන් පසු රාජත්වයට උරුමකම් කීවේ වැඩිමහල් පුත්‍රයා ය. පණ්ඩුවාසුදේව රජුගෙන් පසු ඔහුගේ වැඩිමහල්

*ISBN 978-955-4563-72-8*

පුත්‍රයා වූ අභය රාජත්වයට පත් වී ය (*මහාවංසය*, 1994).එසේ ම පණ්ඩුකාභයගෙන් පසු බලයට පත් වූයේ ඔහුගේ වැඩිමහල් පුත්‍රයා වූ මුටසීව යි (*මහාවංසය*, 1994). මේ ආකාරයට සිංහාසන උරුමය සම්බන්ධයෙන් මෙවැනි සම්ප්‍රදායක් ඇති වන්නට භාරත බලපෑම ලැබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

## නිගමනය

මේ අනුව බලනවිට භාරතීය නෛතික මූලධර්ම පැරණි ශ්‍රී ලංකාවේ නෛතික පද්ධතිය සකස්වීම කෙරෙහි බලනොපෑවේ යැයි කිව නොහැකි ය. එයට හේතුව භාරතීය නීති ක්‍රම හා සිරිත් විරිත් මෙරටට බලපෑ බවට සාධක දක්නට ලැබෙන බැවිනි.මෙම කරුණු විමසා බැලිම තුළින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ නීතිය හැඩ ගැස්වීම කෙරෙහි උත්තර භාරතයේ මෙන් ම දක්ෂිණ භාරතයේ ද පැවති සිරිත් විරිත්, සම්ප්‍රදායයන් ඉවහල් වූ බව යි.නමුත් මේවා ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට එක්වී සකස්වීමේදී ශ්‍රී ලංකාවට ම ආවේණික වූ ආකාරයකින් ක්‍රියාත්මක වූ බව කරුණු විමසීමේදී ස්ඵුට වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*ඌනපූරණසහිතො මහාවංසො*, (1996), බුද්ධදත්ත ථෙර, පොල්වත්තේ, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*මහාභාරතය,*(2006), (පරිවර්තනය), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාවංසය*, (1994), ශ්‍රී සුමංගල නායක මාහිමි සහ දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*රසවාහිනිය*, (1920), සරණතිස්ස ථෙර, කොළඹ, ජිනාලෝක මුද්‍රණාලය.

*සද්ධර්මරත්නාවලිය*, (2011), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රකාශනය.

*Epigraphia Zeylanica.*,vol.V, (1941), Paranavithana, S., Colombo, Published for the Government of Ceylon

ආරියපාල, ඇම්.බී., (1969), (පරි.), *මධ්‍යකාලීන ලංකා සමාජය,*කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
*ඉන්දියාවේ ඉතිහාසය*, (1962), කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු ප්‍රකාශනය.
එල්ලාවල, එච්., *(1962), පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ,* ලංකාණ්ඩුවේ මුද්‍රණය.
මනම්පේරි, පී, (1988), *පුරාතන ලංකාවේ නීතිය හා අධිකරණය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
විද්‍යාලංකාර, අනුත්තරාදේවි, (2000), *පැරණි ලක්දිව නීතිය හා අධිකරණය*, පියසිරි මුද්‍රණය

Jayasekera, M.L.S., (1954), *Customary Laws of Sri Lanka,* Colombo.